## කාලීන සටහන

# විකට් වෙනුවට සල්ලි ගිලින බහිරවයා



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්

ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන



අද බුකියට ගොස් ක්‍රිකට් ඔට්ටු අල්ලන්නේ නැති බව සැබෑ ය. එහෙත් ක්‍රීඩාවේ නීති රීති කිසිවක් නොදන්නා මුත් ඔවුහු අසල්වැසි නිවසකට හෝ ගොස් ඇසි පිය නොහෙළා ක්‍රිකට් තරඟ දෙස බලා සිටින්නේ කාලය ගැන කිසිදු තැකීමක් නොකරය.

පනහට පනහේ තරඟ ඉසව්ව පසුකර දැන් අපි 20 න් 20 ට යොමුවෙමින් සිටිමු. එය සුදුවේ උපරීම "තට්ටුවයි".

අවසාන වශයෙන් මේ සතියේ අවසන් වු එංගලන්ත සංචාරයේ පළමු තරඟයෙන් ලංකාව පරාජය වීම ගැන එංගලන්තයේ සිටින ආදි නාලන්දීය ක්‍රිකට් ක්‍රීඩකයෙකු මා සමඟ දුරකථනයෙන් කළ කතාවක් සඳහන් කිරීම උචිත යැයි සිතේ.

"වැඩක් නෑ අංකල්, මොළේ පාවිච්චි කරන්න එපායැ. වැස්ස වැහැලා, වේළෙන විකට් එකේ බැට් කරන්න එංගලන්තය කැමති වුණේ යටි අරමුණක් ඇතිව. අපිට ඕන නං විරුද්ධ වෙන්න තිබුණා. වෙස්ට් ඉන්ඩීස් අනභිබවනීයව හිටපු වොරල් වීක්ස් සහ වොල්කොට් කාලයේත් වේළෙන විකට්ටුවක 42 කට කැඩී ගියා. එංගලන්තය කළේ ඕවර 2 ක් 3ක් බැට් කරලා අපිව බැට් කරන්න දාපු එක. ඒක උපායක්; උපක්‍රමයක්. අපි අහුවුණා. වෙළෙන විකට්ටුවේ ඉනිමකින් පරාද වුණා." ඔහුගේ මේ තර්කය බොහෝ දුරට යථාර්ථවාදීයැයි මම සිතමි. අප ඉදිරියේ දැන් අභියෝග 2 ක් ඇත.

පළමු වැන්න, ක්‍රිකට් ක්‍රීඩාවට ස්වයං පෝෂිතව නැගී සිටීමට සලස්වන අතර අන්තර් තලයේ පිළිගත් අනෙකුත් ක්‍රීඩාවන්ට රාජ්‍ය අනුග්‍රහය හැකි තරමින් ලබාදීමයි.

දෙවැන්න, ක්‍රිකට් ක්‍රීඩාව සුදුවක් කරගෙන සිතුමතේ මුදල් ගසා කෑම නැති කිරීමට වැට බැඳීමය.

චැනල් 4, වැඩි වන බස් ගාස්තු, විශ්ව විද්‍යාල උද්ඝෝෂණ ඩෙංගු හා ආසනික් යන මේ සියල්ල අබිබවා මේ සතියේ කරළියට පැමිණියේ ක්‍රිකට් ආයතනයේ මාදැල් ගනුදෙනු ය. ඒ පිළිබඳව විවිධ ශීර්ෂපාඨ දෙස පළමුවෙන්ම හැරී බලමු.

,ක්‍රිකට් ආයතයේ කෝටි 200 කට වැඩිය ණයයි.
,ණය බේරන්න රජයෙන් බිලියන 25 ක් ඉල්ලන ක්‍රිකට් බලධාරීන්.
,දස ලක්ෂ දෙසිය පනහක පාඩුවක්.
,ලෝක කුසලානය සඳහා අයවිය යුතු ලක්ෂ තුන්සිය ගණනක් තවම ලැබී නැහැ.
,අලුත් ක්‍රීඩාංගන සෑදීමට මිලියන 80ක්.

මේ ශීර්ෂ පාඨවල ඉලක්කම් කියවන විට පාඨකයා අන්දමන්ද වී වංග ගිරියක පැටලෙයි. ඊට කරන්නට දෙයක් නැත. මක් නිසාද යත්, ලක්ෂය, දස ලක්ෂය, මිලියනය, බිලියනය හා කෝටිය අතර අපේ ජනතාව නන්නත්තාර වී සිටිව නිසාය.

ක්‍රිකට් ආයතනය පාඩු පිරිමසා ගැනීමට රජයෙන් බිලියන ගණන්, කෝටි ගණන්, ලක්ෂ ගණන් ඉල්ලයි නම් එය දිය යුතු බව කියන කොටසක් ද ඇත. ඔවුන්ගේ තර්කය සරලය.

"ක්‍රිකට් අනෙක් ආගම් 4 වගේම අපේ රටේ ද තවත් ආගමක් බවට පත් වී තිබේ." ඔවුහු තර්ක කරති.

දඹුල්ලේ ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකරනවා නම් සුරියවැව තවත් එකක් ඉදිකිරීමේ වරද කුමක්දැයි තවත් අය විමසති.

දැන් ජාතියේ ක්‍රීඩා ලෝලීන්ගේ සැලකිල්ලට යොමුවිය යුත්තේ ක්‍රිකට් වියරුව නිසා අපේ අනෙකුත් ක්‍රීඩා "හඳ රාහු අල්ලන්නාක් මෙන්" විනාශ වී ගොස් ඇති අන්දමය. පසුගිය වසර කිහිපයේ ම අන්තර්ජාතික ක්‍රීඩා තරග වලදී කලාපීය ක්‍රීඩාවලදී "අපේ ස්කෝර් එක" බිංදුවකි.

පාපන්දු හා හොකී යන ක්‍රීඩා මොනවාදැයි දන්නා පාසල් සිසුවකු සොයා ගැනීම පවා දුෂ්කරය.

අධ්‍යාපන ඇමතිතුමා උසස් ශ්‍රේණියේ පාසල් 1000 ක් රට පුරා පිහිටුවන්නට යයි. එතුමාගේ මේ උදාර පරමාර්ථයට අපි සුබ ප්‍රාර්ථනා කරමු. එහෙත් ඇමතිතුමනි, ඔය සුපිරි පාසල් දහසෙන් පනහකවත් ක්‍රිකට් ක්‍රීඩා කරන්නට පහසුකම් සැලැසිය හැකි ද?

එහෙත් ඔය පාසල් දහසේම මලල ක්‍රීඩා පුහුණු කළ හැකිය. තුන් හාරසීයක අත්පන්දු (ඎහෟ ඊඹඹ) කණ්ඩායම් ස්ථාපිත කර හැකිය. පාපන්දු හා හොකී කණ්ඩායම් තුන්හාරසීයක් පෙරට ගෙන ආ හැකිය. මේ සියල්ල සඳහා වැයවන මුදල සුපිරි පාසල් 20 ක ක්‍රිකට් සඳහා වැයවන මුදලට වඩා අඩුබව ගණන් බැලුවහොත් ඔප්පුවනු ඇත. කදිම උදාහරණයක් මගේ සිහියට නැගේ.

1954 දී ආනන්ද මහා විද්‍යාලයේ ක්‍රිකට් පුහුණුකරුවකු හා මලල ක්‍රීඩා පුහුණුකරු අතර ඇති වු අර්බුදයයි.

ආනන්ද මහා විද්‍යාලය එතෙක් පාසල් මලල ක්‍රීඩා සඳහා ලැබෙන "ටාර්බට් කුසලාන" දිනා සිටයේ නැත. එහෙත් 1954 දී එය දිනාගැනීම සඳහා කදිම අවස්ථාවක් උදා වී තිබේ.

යගුලිය, කවපෙත්ත හා හෙල්ල විසි කිරීම අතින් අනභිබවනීය දක්ෂකමක් පෑ සරත් විජේසිංහ නමැති ක්‍රීඩකයෙක් ආනන්දයෙන් බිහිවුයේය. ඔහු ක්‍රිකට් පිටියේ ද, දක්ෂ වේග පන්දු යවන්නෙකි. ඔහු යවන සෑම පන්දුවක් ම විකට්ටුවේ එල්ලයට යොමුවීය.

සරත් විජේසිංහ ක්‍රිකට් පුහුණුවට නොයා මලල ක්‍රීඩා පුහුණුවට යොදවා ගැනීම ගැන ක්‍රිකට් පුහුණුකරු විරෝධය පළ කළේය.

මලල ක්‍රීඩා පුහුණුකරු කියා සිටියේ කුමක්ද?

සරත් පූර්ණකාලීනව පුහුණු වුවහොත් ඔහු නිසැකවම මේ වසරේ පාසල් මලල ක්‍රීඩා උළෙලේ දී වාර්තා 3 ක් පිහිටුවනවා. ක්‍රිකට් කණ්ඩායමට තව එක් කෙනෙකු හොයා ගැනීම එච්චර අමාරු වැඩක් නෙමෙයි.

අන්තිමේදී සරත් මලල ක්‍රීඩා කණ්ඩායම තෝරා ගත්තේ ය.

ඒ වර්ෂයේ දී ආනන්ද මහා විද්‍යාලය ටාර්බට් කුසලාන දිනා ගත්තේ ලකුණු සංඛ්‍යාව අතින් වාර්තාවක්ද පිහිටුවමිනි. සරත් විජේසිංහ යගුලිය, කවපෙත්ත හා හෙල්ල විසිකළේ පැරණි වාර්තා සියල්ල බිඳ දමමිනි. ඔස්වල්ඩ් රාජපක්ෂ රිටිපැනීමේ හා උසපැනීමේ නව වාර්තා පිහිටුවීය. අත්තනගොඩ ඎධජ්‍ඊඔෑජ ) ඤඹඑජ වාර්තා පිහිටුවේ ජ්‍යෙෂඨයන් පිහිටුවන වාර්තා ද අභිබවමිනි. විජිත වීරසේකර බාධක දිවීමේ තරග දෙකම ජයගත්තේ ය.

මේ ක්‍රීඩකයන් එක් කෙනෙකුවත් ක්‍රිකට් කණ්ඩායමට ඇතුළත් නොවීය.

1955 ආනන්ද ක්‍රිකට් කණ්ඩායම මෙහෙයවු ධනසිරි වීරසිංහ දැන් පදිංචිව සිටින්නේ ඕස්ට්‍රේලියාවේ ය. දක්ෂ මලල ක්‍රීඩකයෙකු වු ඔහු එය අතහැර ක්‍රිකට් කණ්ඩායමට යොමු වුයේ මන්ද? යන්න වරක් ඔහු ම මා සමඟ විස්තර කළේය.

මලල ක්‍රීඩාවල වයස් සීමාව අවුරුදු 19 න් පහළ ය. එහෙත් අන්තර් පාසල් ක්‍රිකට් ක්‍රීඩාවේ එය අවුරුදු 20 න් පහළය. අන්තර් පාඨශාලීයය මලල ක්‍රීඩා උළෙලට මගේ වයස බාධාවක් වු බැවින් මම ක්‍රිකට් තෝරා ගතිමි.

ක්‍රිකට් ක්‍රීඩාව ඉංග්‍රීසීන් අපේ කලාපයට ගෙන ආවේ ඊට සම්බන්ධ සාරධර්ම ද සමඟය. ඉවසීම, ඇස හුරු කර ගැනීම, පරෙස්සම හා ස්ථානෝචිත ප්‍රඥාව ද එහි වැදගත් අංග වීය. එද ක්‍රිකට් ක්‍රීඩාවේ නියැලි ප්‍රවීණයෝ අද ඉහත කී සාරධර්ම සියල්ල කුණු කූඩයට තල්ලු වී ඇති බව පිළිගන්නේ සංවේගයෙනි.

දැනට වසර පහකට හෝ හයකට හෝ පෙර ලෝකයේ දක්ෂම ක්‍රිකට් ක්‍රීඩකයා වශයෙන් නම් දරා සිටි දෙන් බ්‍රැඩ්මන් බැහැදැකීමට අමුත්තන් දෙදෙනෙක් ගියහ.

දෙන් බැහැදැකීමට ඉන්දීය සුපිරි ක්‍රීඩක සචින් ටෙන්ඩුර්කාර් කැටුව ගියේ ඕස්ට්‍රේලියාවේ සුපිරි ක්‍රීඩක ෂේන් වෝන්ය.

"සචින්, මම ටෙලිවිශනයෙන් දකිනවා ඔබ බැට් කරන්නේ හරියට මං වගෙයි කියා. හැබැයි අපේ කාලෙ තැන්පත්න කල්පනාවෙන් හා ඇස හොඳට යෙදවීමෙන් අපි ක්‍රීඩා කළා. එහෙත් මේ කලබලකාරි යුගයක ඒ කෞෂල්‍යය වලංගු වන්නේ නෑ." බ්‍රැඩ්මන්ගේ මේ කියමන අද ක්‍රිකට් ක්‍රීඩාවට අත් වී ඇති ඉරණම ගැන කළ ඉඟියක් නොවේද ?

අද ක්‍රිකට් ක්‍රීඩාව තනිකරම වෙළෙඳ ජාවාරමක් හා නොම්බර එකේ සුදුව බවට පත් වී තිබෙන බව අනිවාර්යෙන් පිළිගත හැකිය.

මීට වසර 50කට පෙර අශ්වරේස් පිටියේ කොටින් හෝල්ඩ්ට හා පිගොට්ට ඔට්ටු ඇල්ලු "වට්ටි අම්මලා"

## සන්නස සුබ සරණ දැන්වීම් ප්‍රතිඵලදායකයි




